# Contribution of monks to reduce ethnic problems

ජනවාර්ගික ගැටලු අවම කිරීම සඳහා භික්ෂූන් වහන්සේට ලබාදිය හැකි දායකත්වය

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

'ජනවාර්ගික ගැටලු' යනු වර්තමානයේ ලෝකයේ බොහෝ රටවල් මුහුණ දී ඇති ප්‍රමුඛ අර්බුදයකි. මේ සඳහා බොහෝ රටවල් විසඳුම් සොයමින් පවතින අතර, ඇතැම් රාජ්‍ය මේ සඳහා අනුබලදීම් ද සිදුකරන අයුරු පෙනේ. කෙසේ වෙතත් ජනවාර්ගික ගැටලු යනු හුදෙක් රටක් ප්‍රගමනයෙන් අඩාල කරන්නා වූ ප්‍රබල සාධකයක් සේ සැළකිය හැක. ආර්ථික මෙන් ම සමාජීය වශයෙන් ද උක්ත කාරණාවන් රටක් අවපාතයට යොමුවීමට ප්‍රමුඛව බලපානු ලබයි. මෙහි දී ජනවාර්ගික ගැටලු යනුවෙන් අදහස් කරනු ලබන්නේ යම් රටක ජීවත් වන්නා වූ මනුෂ්‍ය ප්‍රජාව ආගමික වශයෙන් හෝ ජාතීන් වශයෙන් හෝ කුල වශයෙන් හෝ වෙනත් යම් සාධකයන් මූලික කොටගෙන කණ්ඩායම් වශයෙන් බෙදී, එම කණ්ඩායම් වලට ආවේණික වූ නීති රාමුවක් ඔස්සේ, ආචාර ධර්ම පද්දතියක් ඔස්සේ කටයුතු කිරීමත් ඒ තුළින් පොදු රාජ්‍ය නීතීන් උල්ලන්ඝනය කිරීමත් නිසා නිර්මාණය වන්නා වූ උක්ත කණ්ඩායම් අතර නොයෙකුත් අර්බුදයන් ය.

ලෝකයේ බොහෝ රටවල් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ඉතා කුඩා වූ රාජ්‍යයන් කිහිපයක් හැර අන් සියලු රාජ්‍යයකම පාහේ නොයෙකුත් වර්ගයන්ට අයත් ජාතීන් ජීවත් වෙති. ජාතීන් වශයෙන්, ආගමික වශයෙන්, කුල ගෝත්‍ර වශයෙන්, වර්ණ වශයෙන් මෙකී වර්ගයන්හි බෙදීම් දක්නට ඇත. මෙසේ වර්ගවාදීත්වය තුළ ජීවත් වන්නා වූ මනුෂ්‍ය සන්තානයෙහි නොයෙකුත් විෂම වූ අදහස් ආකල්ප නිර්මාණය වීම ස්වාභාවික කරුණක් සේ සිතිය හැක. බෞද්ධ දර්ශනයට අනුව කිසිදු පුද්ගලයෙකු උපතින් අන්‍යයන් හා සමාන වූ ආකල්ප, සිතුවිලි, අදහස් ඇතිව නිර්මාණය නොවෙති. පුද්ගලයා උප්පත්තියෙන් අනතුරුව තමා ජීවත් වන්නා වූ සමාජ වටපිටාව තුළින් ලැබෙන්නා වූ ආකල්ප අදහස් අනුව ස්ව චින්තනය නිර්මාණය කරගනු ලබන බව නිරවද්‍ය කරුණකි. මෙකී පුද්ගලයන් අතර සැමට පරිබාහිර වූ ආකල්ප අදහස් ඇති පුද්ගලයෙකු සිටිය නොහැකි බව මෙයින් අදහස් නොකෙරේ. නමුත් සමස්තයක් ලෙස මිනිසා සමීප වූ සමාජ පසුබිම ඔස්සේ ස්ව ආකල්ප නිර්මාණය කරගනු ලබයි. නිදසුන් ලෙස ශ්‍රී ලාංකික ජන සමාජයේ බොහෝ පිරිසක් සිංහල බෞද්ධයෝ වෙති. මෙකී සිංහල බෞද්ධයන් සියල්ලන් ම පාහේ ථෙරවාද බෞද්ධ සංස්කෘතිය අනුගමනය කරන්නා වූ පිරිසකි. නමුත් ලෝකයේ වර්තමානය තුළ ථෙරවාද, මහායාන, තන්ත්‍රයාන යනුවෙන් බෞද්ධ දර්ශනයේ ප්‍රධාන ශාඛාවන් තුනක් දක්නට ඇත. එයින් ශ්‍රී ලාංකීය බෞද්ධ ජනතාව මහායාන බෞද්ධ දර්ශනය හෝ තන්ත්‍රයාන බෞද්ධ දර්ශනය අනුගමනය නොකරති. ඔවුන් සියල්ලන් ම පාහේ ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය පමණක් අනුගමනය කරනුයේ අන්‍ය සම්ප්‍රදායයන් පිළිබඳ අවබෝධය ලබා එය වැරදි වූ

මාර්ගයක් ලෙස ප්‍රත්‍යක්‍ෂ වූ නිසාවෙන් නොව, තම ජන සමාජය තුළ බහු සම්මතය, බහු භාවිතය ථෙරවාද දර්ශනය නිසාවෙනි.

වර්ගවාදීත්වය තුළින් ඇතිවන්නා වූ විෂම වූ අදහස් අන්‍යයන්ට සාපේක්‍ෂව හුදු නිරවද්‍ය සාධක සේ දැක්වීම උචිත නොවේ. මන්ද යමෙක් සිය වර්ගයට හෝ ජාතියට අනුව දක්වන්නා වූ කරුණක් අනෙක් වර්ගයකට හෝ ජාතියකට අනුව එය සාවද්‍ය කාරණයක් විය හැකි ය. නිදසුනක් ලෙස හින්දු දහම තුළ ගවයා පූජනීයත්වයෙන් සළකා ගරු බුහුමන් සිදුකරනු ලබන අතර, මුස්ලිම් ආගමෙහි ගවයා ආහාරයට ගතයුතු, දෙවියන් වහන්සේ විසින් මිනිස් ආහාරය සඳහා ම නිර්මාණය කල සත්වයෙකු ලෙස දක්වයි. එමෙන් ම ගවයා මරණයට පත් කළයුතු ආකාරය පිළිබඳව ද මුස්ලිම් ආගමික ග්‍රන්ථයන් තුළ විස්තර වී ඇත. මෙහි දී බෞද්ධ දර්ශනය සත්ව ඝාතනය සම්පූර්ණ වශයෙන් ම ප්‍රතික්‍ෂෙප කරන්නා වූ ඉගැන්වීමකි. එසේ ම හින්දු දහම තුළ පුද්ගලයා විෂයෙහි උපතින් ම සමාජ ප්‍රමුඛත්වය හෝ හීනත්වය උරුම කොට දක්වා ඇති අතර, බෞද්ධ දර්ශන උක්ත කාරණය සම්පූර්ණ වශයෙන් ප්‍රතික්ෂේප කරයි. මෙසේ එක් එක් ජනසමාජයන් විසින් දරන්නා වූ ආකල්ප, අදහස්, මතභේද විවිධාකාර වීම ජනවාර්ගික අර්බුදයන්හි මූලබීජයන් ලෙස පෙන්වා දීමට හැකියාව ඇත. එසේම ජනවාර්ගික අර්බුද විශාල වූ ගැටුම් ලෙස ව්‍යාප්ත වීමට බලපානු ලබන තවත් කාරණාවක් වන්නේ පුද්ගලයා ස්ව ජන කණ්ඩායම නියෝජනය කරන්නා වූ සියලු සාධක නිරවද්‍ය වූ කාරණාවන් සේ සැළකීමත්, අන්‍ය සියලු සාධක සාවද්‍ය වූ කාරණාවන් ලෙස හුවා දැක්වීමට උත්සහ දැරීමත් ය.

ජනවාර්ගික අර්බුද නිරාකරණය පිණිස භික්‍ෂුවකගේ දායකත්වය පිළිබඳ කරුණු ගවේෂණයේ දී මූලික සාධකයන් කිහිපයක් ඔස්සේ ඒ පිළිබඳ සාකච්ඡා කළ හැක.

- ජනවාර්ගික අර්බුද යනු කුමක් ද ?
- ජනවාර්ගික අර්බුද නිර්මාණය වීම සඳහා බලපානු ලබන සාධක කවරේ ද ?
- ජනවාර්ගික අර්බුද විසඳීම පිණිස ලබාදිය හැකි විසඳුම් කවරේ ද ?
- ජනවාර්ගික අර්බුද විසඳීම පිණිස භික්‍ෂූන් වහන්සේගේ දායකත්වය

**ජනවාර්ගික අර්බුද යනු කුමක් ද ?**

ජනවාර්ගික අර්බුද යනුවෙන් අදහස් කරනු ලබන්නේ ලෝකයේ හෝ යම් රටක ජීවත් වන්නා වූ ජනතාව අතර කවර හෝ සාධකයක් මූලික කොටගෙන නිර්මාණය වන්නා වූ ගැටුම් ය. මෙහි දී 'ගැටුම' යනුවෙන් මූලික වශයෙන් අර්ථවත් වන්නේ ප්‍රචණ්ඩකාරී සට්ටනයයි. නැතහොත් අරගලයක් හෝ දබරයකි. එහෙත් ප්‍රචණ්ඩකාරී නොවන ගැටුම් ද ගැටුම යන අදහසින් අර්ථකතනය කොට ඇත. ගැටුම් ඇති වන්නේ කිසියම් කණ්ඩායම් දෙකක් හෝ විවිධ කණ්ඩායම් අතර විය හැකි ය. එසේ නැතහොත් රටවල් දෙකක් හෝ රටවල් කිහිපයක් අතර විය හැකි ය. පවුල් ඒකක අතර, සමාජ පංති අතර, වාර්ගික කොටස් අතර, ශ්‍රමිකයන් අතර, සේවායෝජකයන් අතර හා සේවකයන් අතර ද ගැටුම් ඇතිවිය හැක. මහාපරිමාණ හා සුළු වශයෙන් වන්නා වූ මෙම ගැටුම් ඇති වන්නේ, ගැටුමක පාර්ශ්වකරුවන් විසින්

පරස්පර විරෝධි නැතහොත් එක සමාන නොවන අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීමට කරනු ලබන උත්සහයන්හිදී ය. මේ අර්ථයෙන් ගත්කළ ගැටුමක් යන්න විවරණය කළ යුත්තේ විවිධ කණ්ඩායම් විසින් අනනුරූපි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට දරනු ලබන ප්‍රයත්නයන් නිසා හටගන්නා වූ දෙයක් ලෙසිනි.

සිංහල භාෂාවේ 'ගැටුම' යන්න පාලි භාෂාවේ 'සට්ටන' යන පදයෙන් බිඳී ආවකි. එසේම සංස්කෘත භාෂාවේ 'සට්ඨන' යන පදය මූලිකව 'සට්ටන' යන පාලි භාෂා පදය නිර්මාණය වී ඇත. පාලි සිංහල ශබ්ද කෝෂයේ 'සට්ටන' පදයට අර්ථ දක්වා ඇත්තේ 'ගැටීම' 'හැපීම' යනුවෙනි. මෙහි 'ගැටීම' යන්න විග්‍රහ කොට ඇත්තේ දෙකක් හෝ ඊට වැඩි ගණනක් හෝ එකිනෙකට ගැටීම යනුවෙනි. 'හැපීම' යනු 'ස්පර්ශය' හෙවත් 'හැප්පෙන සුළු ස්වභාවයයි'. එසේ ම පාලි සිංහල අකාරාදිය තුළ 'සට්ටන' යන පදයට සිංහල අරුත් සපයා ඇත්තේ 'හැපීම' 'කලහය' යනුවෙනි. 'කලහය' යන වචනය සිංහලයේ අර්ථ විග්‍රහයට අනුව 'කෝලාහලය' 'අමනාපව ක්‍රියා කිරීම' වැනි තේරුම් ගම්‍ය වේ. එනම් ගැටුම් නිර්මාණය වන්නා වූ අවස්ථාවයි.

**ජනවාර්ගික අර්බුද නිර්මාණය වීම සඳහා බලපානු ලබන සාධක කවරේ ද ?**

ජනවාර්ගික අර්බුද නිර්මාණය වීම සඳහා පදනම් වන්නා වූ කාරණාවන් පිළිබඳ විමසීමේ දී වර්තමාන ලෝකයේ බොහෝ රටවල් තුළ උක්ත ගැටලුව නිර්මාණය වීම සඳහා බලපා ඇති ප්‍රමුඛ කාරණාවන් කිහිපයක් හඳුනාගත හැක.

- ජාති භේදය පිළිබඳ ගැටුම්
- ආගම් භේදය පිළිබඳ ගැටුම්
- දේශපාලනික මතභේද
- වර්ණ භේදය

**ජාති භේදය පිළිබඳ ගැටුම්**

ජනවාර්ගික අර්බුදයන්හි දක්නට ඇති ප්‍රමුඛ ගැටලුවක් ලෙස ජාති භේදය දැක්විය හැක. මෙම කාරණාව ආගමික හා දේශපාලනික ස්වරූපයන්ගෙන් බාහිරව තේරුම්ගත යුත්තකි. ජාතීන් වශයෙන් ගත්කල දේශපාලනික වශයෙන් ද නොයෙකුත් අර්බුද නිර්මාණය වී ඇත. නිදසුනක් ලෙස පකිස්ථානයත් ඉන්දියාවත් අතර ඇත්තේ ජාතීන් පිළිබඳ වූ දේශපාලනික අර්බුදයකි. නමුත් උක්ත ජාති භේදය පිළිබඳ ගැටුම් යනුවෙන් අදහස් කරනු ලබනුයේ එකම රටක් තුළ ජීවත් වන්නා වූ නොයෙකුත් ජාතීන් අතර නිර්මාණය වන්නා වූ අර්බුදයන් ය. නිදසුන් ලෙස ශ්‍රී ලංකාව තුළ සිංහල, දෙමළ, මුස්ලිම් යනුවෙන් ප්‍රධාන ජාතීන් තුනක් දක්නට ඇති අතර, මෙය ආගමික වශයෙන් වෙන් වන්නා වූ සමාජ කණ්ඩායම් වලට අයත් නොවේ. සිංහල ජාතියට අයත් කිතුනුවන් ද බොහෝ පිරිසක් අප රටේ ජීවත් වෙති. මෙසේ සිංහල, දෙමළ, මුස්ලිම් යන ජාතීන් අතර ජාතිය පදනම්ව වන්නා වූ අර්බුදයන් අප රටේ පවතින එක් ප්‍රධාන ජනවාර්ගික ගැටලුවක් ලෙස දැක්විය හැකි ය.

ශ්‍රී ලංකාව තුළ මෑත යුගයක් දක්වා බලපෑ ප්‍රධාන ගැටලුව වූයේ යුද්ධයයි. මෙය වසර තිහකට අධික කාලයක් රටටත්, රටේ ජීවත් වන්නා වූ සමස්ත ජනතාවටත් මහත් වූ විපත් නිර්මාණය කළා වූ සාධකයක් විය. ඉන් සිදු වූ විනාශය පිළිබඳ විස්තර දැක්වීම අවශ්‍ය වන්නේ නැත. මෙවන් වූ මහත් ගැටලුවක් රටෙහි නිර්මාණය වීම සඳහා බලපෑ ප්‍රමුඛ සාධකය වූයේ ජාතිය පිළිබඳ ඇතිවූ ඝට්ටණයයි. ඇතමෙක් මෙය දේශපාලනික වශයෙන් ඇති වූ අර්බුදයක් ලෙස ද පෙන්වා දීමට හැක. නමුත් එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් ඊළම වශයෙන් ඉල්ලූයේ දෙමළ ජනතාව සඳහා පමණක් වෙන් වූ සීමාවකි. දෙමළ ජනතාව සඳහාම වූ රාජ්‍යයකි. එය දේශපාලනික අර්බුදයක් වන්නේ නම් සිංහල හෝ අන්‍ය ජාතීන්ට ද එම ප්‍රදේශය තුළ සුළු ප්‍රමාණයෙන් හෝ අයිතිවාසිකමක් පැවතිය යුතු ය. මන් ද උතුරේ මෙන් ම දකුණේ ද බොහෝ දෙමළ ජනතාවක් ජීවත් වන නිසාවෙනි. එසේ ම රටක් තුළ සියලු ජනයා විෂයෙහි සාධාරණත්වයක් පැවතිය යුතු නිසාවෙනි. නමුත් එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් වසර ගණනාවක් යුද්ධ කළේ දෙමළ ජාතියට පමණක් සීමා වූ ප්‍රදේශයක් වෙනුවෙන් ය. ඒ තුළින් අප රට ආර්ථික වශයෙන් මෙන් ම සාමාජීය වශයෙන් කෙතරම් පහළ වැටුනේ ද යන්න විමසීමේ දී වර්තමානයේ අපහට එයින් ගොඩ ඒමට පවා අපහසු තත්වයක පවතියි. එයින් සිදුවූයේ මහත් විනාශයක් පමණි. එසේ ම බොහෝ මනුෂ්‍ය ජීවිත ප්‍රමාණයක් අහිමිවීම හා රටේ භෞතික සම්පත් විනාශයයි. එමෙන් ම රටට දැරිය නොහැකි ආකාරයෙන් විදේශයන්හට ණය වීමට සිදුවීමයි. දැනට වසර කිහිපයකට පෙර රටේ පැවති මෙම යුද්ධය අවසන් වී ඇති නමුත් රටේ ජීවත් වන්නා වූ ජාතීන් අතර පවතින්නා වූ යුද්ධය අවසන් වී ඇද්දැයි විමසිය යුතු කරුණකි. සැබවින්ම එය අවසන් වී නොමැති බව අප හට මනාව විද්‍යමාන වන්නා වූ කාරණයකි. මෑත කාලය තුළ උතුරු ප්‍රදේශයේ ඇති වූ නොයෙකුත් සිදුවීම් මෙයට නිදසුන් ලෙස පෙන්වා දීමට හැකියාව ඇත. යාපනය විශ්වවිද්‍යාලයේ සිංහල හා දෙමළ ශිෂ්‍යයන් අතර ඇති වූ ගැටුම මෙයින් එක් අවස්ථාවකි. ජාතියක් ලෙස දෙමළ ශිෂ්‍ය ප්‍රජාවට සිංහල චාරිත්‍ර වාරිත්‍ර දැකීමට, ඉවසීමට ශක්තියක් නොතිබෙන්නට ඇත. නැතහොත් යටපත් වූ ජාතිවාදි ආකල්පයන් නැවත ඉස්මතු වන්නට ඇත. සැබවින්ම මෙහි දී සිංහල ශිෂ්‍ය ප්‍රජාව තුළින් ද යම් යම් ගැටුම්කාරි ක්‍රියාකලාපයන් සිදුවන්නට ද ඇතැයි සිතිය හැක. කෙසේ හෝ සිදු වූයේ ජනවාර්ගික අර්බුදයන් නැවත ඉස්මතු වීම යි. මෙයට අමතරව සිංහල මුස්ලිම් ජාතීන් අතර ද මහත් වූ විනාශයක ජාතිවාදී අර්බුදයක් නිර්මාණය වීම සඳහා මූලබීජ සැකසෙමින් පවතින ආකාරය දැකගත හැක. පසුගිය කාලවකවානුව තුළ බේරුවල ආදි ප්‍රදේශ වල සිදු වූ සිංහල බෞද්ධ හා මුස්ලිම් ජනතාව අතර ගැටුම් නිදසුන් ලෙස පෙන්වා දීමට පුළුවනි.

මෙම ජාතිවාදි අර්බුදය වර්තමානයේ දී නිර්මාණය වූවක් නොව, ඒ සඳහා දීර්ඝ ඉතිහාසයක් ඇත. වසර ගණනාවකට පෙර අනුරාධපුර, පොලොන්නරු ආදි රාජ්‍ය යුගයන්හි පවා අප රට තුළ උක්ත අර්බුදයන් නිර්මාණය වූ අයුරු වංශකතාවන්හි වාර්තා වේ. වළගම්බා, දුටුගැමුණු ආදි රාජ්‍ය සමයන් හි විදේශික වූ නොයෙකුත් ජාතීන් පවා අප රට ආක්‍රමණය කොට ජාතිවාදි අර්බුදයන් ව්‍යාප්ත කළහ. මෙය දේශපාලනික අර්බුදයන් සේ පෙනීගිය ද එම ආක්‍රමණයන් සිදු වී ඇත්තේ එක් ජාතියකට අදාළ ජන කොට්ඨාසයන් තුළිනි. සොළී, පාණ්ඩ්‍ය යනු එවැනි එක් ජාතියකට අදාළ වූ ආක්‍රමණිකයෝ ය. එමෙන් ම පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි යනු ද එවැනි එක් ජන කොට්ඨාසයකට අයත් වූ පිරිසකි. ඉතිහාසයේ සිදු වූ මෙම ජාතිවාදී අර්බුද වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ නිර්මාණය වී ඇති ජාතිවාදි අර්බුදය සඳහා මූලබීජ

වන්නට ඇතැයි ද සිතිය හැක. ලෝකය පිළිබඳ විමසීමේ දී ද නොයෙකුත් රටවල් අතර වර්තමානයේ නිර්මාණය වී ඇති අර්බුද දේශපාලනික අරමුණු වලින් එහා වූ මෙම ජාතිවාදී මතභේදයන් පදනම් වී ඇති ආකාරය මනාව හඳුනාගත හැකි කරුණකි.

**ආගම් භේදය පිළිබඳ ගැටුම්**

'ආගම' යන පදය බොහෝ දුරට පුද්ගල ආධ්‍යාත්මය හා සම්බන්ධ වූවකි. ලෝකයේ ජීවත් වන්නා වූ මනුෂ්‍ය ප්‍රජාවගෙන් සීමිත වූ පිරිසකට හැර අන් සියලු දෙනාට නිශ්චිත වූ එක් ආගමක් ඇත. ආගම තුළින් සිදුවන්නා වූ ප්‍රමුඛ කාරණාව නම් පුද්ගල ආධ්‍යාත්මය සුවපත් කරලීමයි. මේ අනුව වර්තමාන ලෝකයේ බෞද්ධ, කිතුනු, මුස්ලිම්, හින්දු ආදි ප්‍රමුඛ වූ ආගම් කිහිපයක් දැකගත හැකි ය. මෙකී ආගමික මතවාදයන් පිළිබඳව විමර්ශනාත්මකව බැලීමේ දී උක්ත දර්ශනයන් අතර නොයෙකුත් පරස්පරවාදී වූ මතවාදයන් හමු වේ. එක් ආගමක් තුළ නිවැරදියැයි සම්මත වූ දෙයක් අනෙක් ආගමෙහි බරපතල වූ වැරදි ක්‍රියාවක් ලෙස හුවා දක්වා ඇත. නිදසුන් ලෙස ඉහත දැක් වූ ප්‍රාණඝාතය ආදි ක්‍රියාවන් පිළිබඳ ආකල්පයන් පෙන්වා දිය හැකි ය. මීට අමතරව වර්තමාන ලෝකයේ ආගමික පසුබිම දෙස බැලීමේ දී ආධ්‍යාත්මික මුහුණුවර පමණක් නොව බාහිර ලෝකයේ සියලු පුද්ගල ක්‍රියාකාරකම් හා සම්බන්ධව ආගමික පසුබිම සම්බන්ධ වී ඇති අයුරු දැකගත හැකි ය. නිදසුන් ලෙස පුද්ගලයා වර්තමානයේ දී දේශපාලනික අරමුණු පවා ඉටුකරගැනීමට යොමු වී ඇත්තේ ආගමික පසුබිමක් තුළ ය. එසේ ම ඔවුන්ගේ ආර්ථික කටයුතු ද සිදුවනුයේ මෙම ආගමික ඉගැන්වීම් වලට අනුකූලවය. මෙසේ පුද්ගල ජීවිතයේ ආරම්භයේ පටන් අවසානය තෙක් සියලු කාර්යයන්ගේ ප්‍රමුඛ සාධකය වී ඇත්තේ ආගමයි. ආගම පුද්ගලයාට මෙසේ බලපෑමක් සිදුකරනු ලබන්නේ කුමන කාරණාවක් පදනම් කොටගෙනදැයි විමසීමේ දී එය පුද්ගලයාගේ ආධ්‍යාත්මය හා සම්බන්ධ වූ ගැටලු විෂයෙහි පිළිතුරු ලබාදෙන්නා වූ මාර්ගය බැවින් බව දැක්වීම සාවද්‍ය කාරණාවක් නොවේ. පුද්ගලයාගේ මෙලොව ජීවිතයෙන් අනතුරුව වන්නා වූ සියලු ක්‍රියාදාමයන් ආගමික මුහුණුවර ඔස්සේ විග්‍රහ වී ඇත. එසේ ම යහපත් වූ හෝ අයහපත් වූ හෝ පුද්ගලයෙකු සඳහා අවශ්‍ය කාරණාවන් ඉගැන්වෙන්නේ ද ආගමික පසුබිම තුළ ය. එබැවින් පුද්ගලයා නිරතුරු ආගමික පසුබිම හා බැඳී පවතී. එය ඔහුට සිය ජීවිතයේ කිසි දිනෙක ඉවත් කිරීමට නොහැක්කා වූ ප්‍රබල සාධකයකි.

මෙසේ විග්‍රහ වූ ආගමික පසුබිම ද ජනවාර්ගික අර්බුද විෂයෙහි ප්‍රබල සාධකයක් ලෙස පෙන්වාදිය හැකි ය. මේ පිළිබඳ අධ්‍යනයේ දී පළමුව සාකච්ඡා කළ යුතු වන්නේ පුද්ගලයා ඒ ඒ ආගමික පසුබිම් තුළට නැඹුරු වීම කෙබඳු ආකාරයෙන් සිදුවේද යන්නයි. ඒ ඒ ආගමික දර්ශනයන් පිළිබඳ අධ්‍යයනය කොට, අවබෝධය ලබා යම් ආගමකට පුද්ගලයා යොමුවිය යුතු බව බෞද්ධ දර්ශනය ඇතුලු යම් යම් ඉගැන්වීම් තුළ විග්‍රහ වී තිබුණ ද වර්තමානයේ බොහෝ පුද්ගලයන්ගේ ආගමික පසුබිම තීරණය වන්නේ උක්ත කාරණාව මූලික කොටගෙන ද, යන්න අප විමසිය යුතු කරුණකි. බොහෝ පුද්ගලයන්ගේ

ආගමික පසුබිම ඔහුගේ උප්පත්තියේදී ම තීරණය වී අවසානය. එම පුද්ගලයාගේ දෙමාපියන්, පරම්පරාව ආදි සාධක මූලික කොටගෙන පුද්ගලයාට ආදි යුගයේ මෙන් ම වර්තමානයේ ද තම ආගමික පසුබිම තීරණය කිරීමට සිදුව ඇත. මෙයින් වෙන් ව ස්ව චින්තනයට අනුකූලව ගැලපෙන්නා වූ ආගමික පසුබිමක් තෝරා එය අනුගමනය කරන්නා වූ යම් පුද්ගලයෙක් වේ ද ඒ සමස්ත ප්‍රජාවගෙන් අතලොස්සකි. එමෙන්ම උපතින් පුද්ගලයෙකු උරුම කරගන්නා වූ ආගම වෙනස් කිරීම ඉතා බරපතල වූ වැරදි ක්‍රියාවක් ලෙස ඇතැම් ආගමික ඉගැන්වීම් තුළ දක්වා ඇති බැවින් ස්ව චින්තනයට අනුව කටයුතු කිරීම ආගමික පසුබිම් තුළ පවා වළක්වා ඇත.

මෙසේ උපතින් උරුම කරගන්නා වූ ආගමික චින්තනය පුද්ගලයාගේ වර්ධනයත් සමඟ අධ්‍යයනය කිරීමට හැකියාව ඇත. එහි දී ස්වච්ඡන්දතාවයට අනුව නොව ආගමික ඉගැන්වීම් වලට අනුකූලව පුද්ගලයාට හොඳ නරක, වැරදි නිවැරදි ආදි සියල්ල තීරණය කිරීමට සිදු වේ. මෙහි දී බෞද්ධ දර්ශනය ඇතුලු සීමිත ඉගැන්වීම් කිහිපයක පමණක් ස්වච්ඡන්දතාවය මත වැරදි නිවැරදි, හොඳ නරක ආදිය පිළිබඳ පුද්ගලයාට තීරණය ගැනිමට අවස්ථාව සළසා ඇත. ස්වච්ඡන්දතාවය අවම වූ, ආගමික චින්තනය නිතී ධර්ම ලෙස ක්‍රියාත්මක වන්නා වූ ආගම් ලෙස මුස්ලිම් හින්දු ආදි ඉගැන්වීම් ප්‍රමුඛව හඳුනාගත හැකි ය. දේවවාදී සියලු ඉගැන්වීම් තුළ මෙකී ලක්‍ෂණය අල්ප වශයෙන් හෝ දැකගත හැක. මෙහි දී පුද්ගලයා විෂයෙහි පමණක් නොව සමාජය විෂයෙහි ද සියලු අධිකාරීත්වය දරනු ලබන්නේ දෙවියන් වහන්සේ විසිනි. ලෝකයේ මැවුම්කරු ලෙස සළකනු ලබන මෙම දේවත්වය පුද්ගලයාගේ මෙන් ම සමාජයේ ද සියලු දේ පිළිබඳ තීරණය කරනු ලබයි. පුද්ගල අධිකාරීත්වය තුළ නිවැරදි වූ දෙය දේව අධිකාරිත්ව තුළ වැරදි සහගත ක්‍රියාවක් ලෙස විග්‍රහ වී ඇත. හින්දු දර්ශනයේ දක්නට ලැබෙන වර්ණ ධර්ම, වර්ණාශ්‍රම ධර්ම ආදිය ද, මුස්ලිම් කිතුනු ආදි ආගමික චින්තනයන්හි විග්‍රහ වන්නා වූ දෙවියන් වහන්සේගේ ලෝක මැවීම් පිළිබඳ පුවත් ද මෙහි දී නිදසුන් ලෙස පෙන්වා දිය හැකි ය. මෙසේ ආගමික පසුබිම් තුළ පුද්ගලයාට ක්‍රියාවෙන් සිදුකිරීමට පවා සිතීමටවත් නොහැකි ආකාරයෙන් ආගමික දර්ශනය පුද්ගලයා බැඳ දමා ඇති අයුරු දැකගත හැකි ය. ඒ තුළ පුද්ගලයා කුඩා කල පටන් ස්ව ආගමික චින්තනය නිවැරදි වූ මාර්ගය ලෙසත්, එය එකම වූ දර්ශනය ලෙසත්, ඉන් පරිබාහිර වූ අන්‍ය සියලු ආගමික ඉගැන්වීම් වැරදි සහගත ඉගැන්වීම් ලෙසත්, එම අන්‍ය ආගමික චින්තනයන් අනුගමනය කරන්නා වූ පුද්ගලයින් වැරදි මාර්ගයේ ගමන් කරන්නා වූ එමෙන් ම තමාට ද තම ආගමට ද විරුද්ධවාදී වූ පිරිසක් ලෙසත් කල්පනා කරති. මෙකී චින්තනය තුළ ස්ව ආගම ජයග්‍රහණය කිරීම විෂයෙහිලා පුද්ගලයා විසින් සිදුකරනු ලබන්නා වූ නොයෙකුත් ක්‍රියාකාරකම් පදනම් කොටගෙන වර්තමාන ලෝකයේ ජනවාර්ගික අර්බුද නිර්මාණය වී තිබේ.

වර්තමාන ලෝකයේ වන්නා වූ ජනවාර්ගික අර්බුද සඳහා පදනම් වී ඇති ප්‍රමුඛතම ගැටලුව ලෙස මෙම විෂම වූ ආගමික ඉගැන්වීම් දැක්විය හැකි ය. ස්ව ආගම ප්‍රචාරය කිරීමත්, අන්‍ය ආගමිකයන් මරා දැමීමත්, ඒ සඳහා යුද්ධ කිරීමත් අනුමත කරන්නා වූ ආගමික චින්තනයන් ද පැවතීම වර්තමානයේ දී නොරහසකි. එවන් පසුබිමක සමාජයක් තුළ ජීවත් වන්නා වූ නොයෙක් ආගමික සම්භවයන් ඇති පුද්ගලයන් අතර ගැටුම් නිර්මාණය වීම අහඹු කාරණාවක් ලෙස සැළකීමට නොහැකි ය. මෙසේ වූ

ආගමික ගැටලු විෂයෙහි විසඳුම් සෙවීමේ දී බොහෝ කරුණු අධ්‍යයනය කළ යුතුව ඇති අතර, ඒ පිළිබඳ පසුව සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ.

**දේශපාලනික මතභේද**

රටක් තුළ ජනවාර්ගික අර්බුද නිර්මාණය වීම විෂයෙහි බලපානු ලබන තවත් ප්‍රමුඛ සාධකයක් ලෙස දේශපාලන මතභේද දැක්විය හැකි ය. මෙහි දී දේශපාලනික වශයෙන් ඇතිවන්නා වූ ජනවාර්ගික අර්බුදයන් ප්‍රධාන වශයෙන් අවස්ථා දෙකක් ඔස්සේ පෙන්වා දීමට හැකි ය.

- ❖ දේශීය වශයෙන් සිදුවන්නා වූ දේශපාලනික බෙදීම්
- ❖ ජාත්‍යන්තර වශයෙන් සිදුවන්නාවූ දේශපාලනික බෙදීම්

දේශිය වශයෙන් සිදුවන්නා වූ මතභේද පක්ෂ වශයෙන් හෝ පුද්ගල කේන්ද්‍රීයව සිදු වේ. මෙහි දී රටක් තුළ නිර්මාණය වී ඇත්තා වූ ප්‍රධාන දේශපාලනික පක්ෂයන්ට අමතරව ඇත්තා වූ නොයෙකුත් කුඩා දේශපාලනික පක්ෂ බොහෝ දුරට නිර්මාණය වී ඇත්තේ ඒ ඒ ජන කොට්ඨාසයන් නියෝජනය කරමිනි. නිදසුන් ලෙස සිංහල, මුස්ලිම්, දෙමළ ජනතාව නියෝජනය කරමින් සුළු දේශපාලනික පක්ෂ රාශියක් අප රටේ නිර්මාණය වී ඇත. මේවායේ ඇත්තා වූ සැබෑ දේශපාලනික අරමුණු පිළිබඳ විමසා බැලීමේ දී බොහෝ දුරට සිදුවන්නේ එම දේශපාලනික පක්ෂ සිය වර්ගයා වෙනුවෙන් කටයුතු කිරීමයි. එහි දී ඔවුහු පොදු දේශපාලනිකත්වය පසෙක ලා සිය ජනතාව වෙනුවෙන් පමණක් පෙනී සිටී. මේ තුළින් එම දේශපාලනික පක්ෂ නියෝජනය කරන්නා වූ ප්‍රදේශයන්හි ජීවත් වන්නා වූ අනෙකුත් ජාතීන් වෙත නොයෙකුත් අසාධාරණකම් සිදුවන අතර, ඒ තුළ වර්ගවාදී මානසිකත්වය නිතැතින්ම පුද්ගලයා තුළ නිර්මාණය වේ. පොදු ජනතාවගේ අභිමථාර්ථයන් පසෙක දමා මෙසේ සිය ජාතීන් වෙනුවෙන් පමණක් දේශපාලනයේ යෙදීම රටක් තුළ ජනවාර්ගික අර්බුද නිර්මාණය වීමේ ලා සාධනීය වූ කාරණාවක් ලෙස දැක්විය හැකි ය.

එසේ ම පුද්ගල කේන්ද්‍රීයව ද ක්‍රියාත්මක වන්නා වූ දේශපාලනික ක්‍රියාදාමයන් අප රට තුළ බොහෝ සෙයින් දැකිය හැකි ය. ඒ ඒ ප්‍රදේශයන් තුළ බහුජන සම්මතයන්ගෙන් තේරී පත් වන්නා වූ දේශපාලනික නායකයන් තම පෞද්ගලික අභිමථාර්ථ සාධනය උදෙසා සිය වර්ගයට අයත්, එසේ ම බහුජන නියෝජනය වන්නා වූ ඒ ඒ ප්‍රදේශ තුළ තම දේශපාලන බලය තහවුරු කරගනු ලබයි. එහි දී ඔවුන්ගේ ක්‍රියාකලාපය ද සිදුවන්නේ හුදෙක් බහුජන නියෝජනය සඳහා පමණි. මෙහි දී ඔවුහු එම ප්‍රදේශවල ජීවත් වන්නා වූ සුළුතර පිරිසකගේ අපේක්ෂාවන් උදෙසා කුමන ආකාරයක හෝ පෙනීසිටීමක් දැකගත නොහැකි ය.

පක්ෂ දේශපාලනිකත්වය තුළ හෝ පුද්ගල කේන්ද්‍රීය දේශපාලනය තුළ ඇත්තා වූ මෙම අර්බුදයන් පදනම් කොටගෙන එම අසාධාරණකම් වලට එරෙහිව පෙනී සිටින්නා වූ නොයෙකුත් සිවිල් සංවිධාන රටතුළ නිර්මාණය වී ඇත. මෙම සිවිල් සංවිධානයන් ද නිර්මාණය වනුයේ ස්ව ජාතිය, ස්ව වර්ගය මූලික කොටගෙන බව එහි ක්‍රියාකලාපයන් පිළිබඳ විමර්ශනය කිරීමේ දී මනාව දැකගත හැකි කරුණකි.

වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ ද සිංහල ජාතිය වෙනුවෙන් පෙනී සිටින්නා වූ සිවිල් සංවිධාන මෙන් ම නොයෙකුත් ජාතික සංවිධානයන් ද බොහෝ ප්‍රමාණයක් දැකගත හැකි ය. මෙහිදී ද සිංහල බෞද්ධයන් වෙනුවෙන් ම පෙනී සිටින්නා වූ වෙනම සංවිධානයන් ද අපමණ ය. මේ ආකාරයෙන් දෙමළ ජනතාව වෙනුවෙන් ද මුස්ලිම් ජනතාව වෙනුවෙන් ද පෙනී සිටින්නා වූ වෙන වෙනම සංවිධාන දැකගත හැකි ය. මේ සියලු සංවිධානයන්ගේ ක්‍රියාකලාපයන් බොහෝ දුරට සිදුවන්නේ වර්ගවාදී මානසිකත්වයන් තුළ ය. සිය ජාතිය හා ආගම හුවා දැක්වීමටත් අන්‍ය ජාතීන් හා ආගම් පහත් කොට තැකීමටත් මෙම සංවිධාන නිරන්තරයෙන් කටයුතු කරති. මේ තුළින් සිය ජාතීන් වෙනුවෙන් පෙනී සිටීමට අමතරව ඔවුන්ගේ පැවැත්ම හා නොයෙකුත් දේශපාලනික මෙන් ම ආර්ථික ලාභ අපේක්ෂාවන් සාධනය කරගැනීම ද සිදුවේ. මිනිසුන් ප්‍රකෝප වන්නා වූ ආකාරයෙන් නොයෙකුත් දේශන පවත්වමින් වැඩමුළු සාකච්ඡා පවත්වමින් සිදුකරන්නා වූ මෙම සංවිධානයන්ගේ ක්‍රියාකලාපය ජාතීන් අතර එකමුතුව නිර්මාණය වීම උදෙසා, වර්ගවාදී මානසිකත්වය පුද්ගලයා කෙරෙන් ඉවත් කිරීම උදෙසා සිදු නොවීම අභාග්‍යයට කරුණකි. මෙසේ ජාතීන් අතර නොයෙකුත් ගැටුම් නිර්මාණය කරන්නා වූ උක්ත සංවිධාන විෂයෙහි දේශපාලනික සහයෝගය උදාවීම ද එයටත් වඩා බරපතල වූ තත්වයක් ලෙස සැළකිය හැකි ය. සිය පටු දේශපාලනික අරමුණු ඉටුකරගැනීම උදෙසා සිවිල් සංවිධාන නිර්මාණය කරමින් ඒවාට අනුබල ලබාදෙමින් වරප්‍රසාද ලබාදෙමින් කටයුතු කරන්නා වූ නොයෙකුත් දේශපාලනික පක්ෂ මෙන් ම දේශපාලනික නායකයෝ ද අප රටෙහි අපමණ ය.

ජාත්‍යන්තර වශයෙන් ද සිය වර්ගයා උදෙසා, සිය ජාතිය උදෙසා පෙනී සිටිමින් දේශපාලනික අර්බුද නිර්මාණය කරන්නා වූ ස්වරූපයක් වර්තමාන ලෝකයේ මිනිසා තුළින් දැකගත හැකි ය. මෙහි දී ලෝකයේ ඇත්තා වූ ප්‍රමුඛ ගැටලුව නම් මුස්ලිම් අන්තවාදීන්ගේ ක්‍රියාකලාපයයි. ලෝකය පුරා ඉස්ලාම් රාජ්‍යයන් නිර්මාණය කිරීම උදෙසා අන්‍ය බහුජනතාවන් ජීවත් වන්නා වූ රටවල් විනාශ කරමින් සිය බලය පැතිරවීමට මොවුන් සිදුකරන්නා වූ ක්‍රියාකලාපය ලෝකයේ බොහෝ රටවල් අනුමත නොකරති. එසේම එම ක්‍රියාකලාපයන් හමුවේ ඉවසීමෙන් කටයුතු ද නොකරති. ප්‍රයෝගික වශයෙන් බැලූ කල ඉවසීමෙන් කටයුතු කිරීම ද උචිත කරුණක් ලෙස දැක්විය නොහැක. මෙසේ වන්නා වූ ගැටුම් පදනම් කොටගෙන ලෝකයේ කෙතරම් අර්බුද, විනාශයන් සිදු වී ඇද්දැයි පැහැදිලිව හඳුනාගත හැකිය.

මෙම මුස්ලිම් අන්තවාදයන්ට අමතරව ජාත්‍යන්තර වශයෙන් නොයෙකුත් රාජ්‍යන් අතර ද දේශපාලනික අර්බුදයන් නිර්මාණය වී ඇති අයුරු පෙනේ. මෙම ගැටුම්, ආර්ථිකමය වශයෙන්, ජාතීන් වශයෙන්, ආගමික වශයෙන් ආරම්භව අවසානයේ දේශාන්තර යුධමය තත්වයන් දක්වා වර්ධනය වී ඇත. හින්දු පකිස්ථාන අර්බුදය, උතුරු කොරියා දකුණු කොරියා අර්බුදය, ඉරාන ඉරාක අර්බුදය ආදිය නිදසුන් වශයෙන් පෙන්වා දිය හැකි ය. මේ ආකාරයට රාජ්‍යයන් අතර වූ නොයෙකුත් අර්බුදයන්ගේ ප්‍රතිඵලය වූයේ දෙවන ලෝක යුද්ධය නිර්මාණය වීමයි. මෙසේ දේශපාලනික වශයෙන් සිදු වන්නා වූ නොයෙකුත් අර්බුද ජනවාර්ගික අර්බුද නිර්මාණය වීම පිණිස ප්‍රමුඛව බලපානු ලබන බව පෙන්වා දිය හැකි ය.

දේශපාලනය හා සම්බන්ධ වූ අප රටෙහි මෙන් ම ලෝකයේ ද පවත්නා වූ අනෙක් පැතිකඩ නම් පාලක-පාලිත භේදයයි. පැලැන්ති භේදය යනුවෙන් ද සැළකෙනුයේ මෙම වර්ගවාදීත්වයයි. ජනවාර්ගික අර්බුදයන් විෂයෙහි මේ තුළින් ද සිදුවනුයේ මහත් රුකුලකි. ඒ අනුව ඉහළ පැලැන්තිය, මධ්‍යම පැලැන්තිය, පීඩිත පැලැන්තිය යනුවෙන් ජන කණ්ඩායම් තුනක් අප රටෙහි මෙන් ම ලෝක මට්ටමින් ද දැකිය හැක. මෙහි දී සිදුවනුයේ ඉහළ පැලැන්තිය විසින් සෑම ආකාරයෙන්ම පහළ පැලැන්තිය පාගා සිටීමයි. ඔවුන්ට නැගීසිටීමට අවස්ථාවක් කිසිවිටෙක ලබා නොදීමයි. සියලු වරප්‍රසාද ඔවුන් පමණක් භුක්ති විඳීමයි. පහළ පැලැන්තියේ ශ්‍රමය සූරා කෑමයි. මෙසේ පැලැන්ති වශයෙන් සිදුවන්නා වූ මෙම අසාධාරණය උදෙසා මිනිසා නැගී සිටිනු ඇත. එයින් සිදුවන්නේ ඔවුනොවුන් අතර ගැටුම් නිර්මාණය වීම යි. මෙසේ නිර්මාණය වූ ගැටුම් අප රටෙහි බොහෝ සෙයින් දැකගත හැකි අතර දේශපාලනික වශයෙන් ද පසුකාලීනව සංවර්ධන වන්නේ මේ ආකාරයෙන් නිර්මාණය වූ ගැටුම්වල ප්‍රතිඵලයන් ය.

**වර්ණ භේදය**

මෙය අතීතයේ දේශීය වශයෙන් මෙන් ම විදේශීය වශයෙන් ද ඉතා ප්‍රකටව පැවති ජනවාර්ගික අර්බුදයන් සඳහා බලපෑ ප්‍රධාන සාධකයකි. නමුත් මෙය වර්තමානයේ දී ලෝකයෙන් ක්‍රමිකව අභාවයට යමින් පවතී. මෙහි දී පුද්ගල සමේ වර්ණය මෙන් ම නොයෙකුත් කුලගෝත්‍ර වශයෙන් ද මෙකී බෙදීම් සිදුව ඇත. මෙහි මූලබීජ ප්‍රාග් ඓතිහාසික යුගයන් තුළ පවා දැකගත හැකි ය. භාරතීය ඉතිහාසයට අනුව ඉන්දුනිම්න ශිෂ්ටාචාර තුළ ද මෙකී ලක්‍ෂණ පිළිඹිබු වේ. එහි ආර්ය අනාර්ය භේදය මත, සමේ වර්ණය මත මිනිසා කොටස් දෙකකට බෙදී කටයුතු කළහ. එයින් ආරම්භ වූ වර්ණ භේදය පසුකාලීනව කුලගෝත්‍රවාදී චින්තනයන් ද පදනම්ව විකාශනය වූ බව පෙනේ. වෛදික, ආරණ්‍යක, උපනිෂද් යුගයන්හි පෝෂණය වූ මෙකී භේදය බුද්ධ කාලීන භාරතීය සමාජය තුළ බ්‍රාහ්මණ ඉගැන්වීම් මූලික කොටගෙන මහත් සේ ව්‍යාප්ත වූ නමුදු මෙම කාලවකවානුව තුළ නිර්මාණය වූ බෞද්ධ දර්ශනය පදනම්ව එය ක්‍රමයෙන් අභාවයට පත්විය. භාරතයේ පමණක් නොව ලෝකයේ බොහෝ රටවල මෙම වර්ණ භේදය ප්‍රකටව ව්‍යාප්ත වූ ජනවාර්ගික අර්බුදයකි. පෙරදිග පමණක් නොව අපරදිග ලෝකයේ ද මෙකී ලක්‍ෂණ ප්‍රකටව හමුවේ. අපරදිග වනාශ්‍රිතව ජීවත් වූ අප්‍රකට මිනිසුන් අතර මෙම කුලගෝත්‍රවාදී ආකල්පයන් ඉතා දැඩි ස්වරූපයෙන් ක්‍රියාත්මක වූ බව දැකිය හැකි ය. තම ගෝත්‍රයට එරෙහිව සිදු කරන්නා වූ සුළු වරදක් වුවද මරණය දක්වා දඬුවම් දීමට තරම් එම චින්තනයන් කෲර තත්වයක පැවතිණි. වර්තමානයේ වුව ද බටහිර ජීවත් වන්නා වූ මෙම අප්‍රකට ජන වර්ගයා අතර මෙම කුලගෝත්‍රවාදය දැඩිව ක්‍රියාත්මක වන අයුරු සොයාගත හැක. එමෙන් ම නූතන බටහිර ලෝකයේ රටවල් වල ද මෑත යුගය දක්වා ශරීර වර්ණය මත පදනම් වූ (සුදු කලු භේදය) ජනවාර්ගික අර්බුදය දක්නට ලැබුණ නමුත් වර්තමානයේ එම තත්වය මිනිසාගේ අවබෝධය මත ක්‍රමයෙන් අවභාවිත තත්වයක පවතී. එය සැබවින්ම ධනාත්මක චින්තනයක ප්‍රතිඵලයක් සේ පෙන්වා දිය හැකිය. අතීතයේ ජනවාර්ගික අර්බුද විෂයෙහි වූ ප්‍රබලම සාධකය වර්තමානයේ මිනිසා අතරින් තුරන් වී ඇත්නම් එයට පාදක වූ කාරණාවන් අප විසින් ගවේෂණය කළ යුතු වේ. එම සාධකයන් පදනම්ව අපට වර්තමාන ලෝකයේ නිර්මාණය වී ඇති ජනවාර්ගික අර්බුදයන් විසඳීම උදෙසා පිළිතුරු සොයාගත හැකි වේ.

**ජනවාර්ගික අර්බුද විසඳීම සඳහා ලබාදිය හැකි විසඳුම් හා යෝජනා**

උක්ත පරිච්ඡේදය අවසන් වූයේ අතීතයේ පුද්ගලයා පීඩිතව පැවති එසේම එක්තරා ජන කණ්ඩායමක් සඳහා අසාධාරණයත් තවත් පිරිසක් උදෙසා උසස් වූ වරප්‍රසාදත් හිමිකර දුන් එමෙන්ම විශාල වූ කලකෝලාහල, ගැටුම් නිර්මාණය වූ භෞතික සම්පත් මෙන් ම මානව සම්පත් මහත් සේ විනාශ වූ ජනවාර්ගික අර්බුදයක නිමාවක් හෙවත් අභාවිත තත්වයක් මතය. උක්ත තත්වය විෂයෙහිලා බලපෑ සාධක හෙවත් විසඳුම් සෙවීමේ දී දක්නට ඇති එකම කරුණකි. එකම වූ විසඳුමකි. එනම් මිනිසාගේ යථාර්ථාවබෝධය හෙවත් චින්තනයේ ප්‍රවර්ධනයයි. මෙහි ආරම්භය දක්නට ඇත්තේ බෞද්ධ දර්ශනය තුළිනි. බුදුරජාණන් වහන්සේ සිය ඉගැන්වීම් තුළින් නිරන්තරයෙන් ස්වච්ඡන්දතාවය අගය කළහ. වර්ගවාදී මානසිකත්වය පුද්ගලයා තුළ නිර්මාණය වන්නා වූ බාහිර බලවේගයන්හි අධිකාරිත්වය බුදුසමයෙහි සම්පූර්ණ වශයෙන් ප්‍රතික්ෂෙප කොට ඇත.

***ඉස්සර නිම්මාණං ඛො පන භික්ඛවෙ සාරතො පච්ඡාගච්ඡතං න හොති ඡන්දො වා වායාමො වා ඉදං වා කරණීයං ඉදං වා අකරණීයන්ති ඉති කරණීයාකරණීයෙ ඛො පන සච්චතො ථෙතතො අනුපලබ්භියමානෙ මුට්ඨස්සතීනං අනාරක්ඛානං විහරතං න හොති පච්චත්තං සහධම්මිකො සමණවාදො*** (අං.නි. තිත්ථායතන සුත්ත)

මෙසේ සියලු බාහිර අධිකාරීත්වයන් ප්‍රතික්ෂෙප කරන්නා වූ බුදුසමය පුද්ගල අධිකාරීත්වය හෙවත් පුද්ගල කේන්ද්‍රීය භාවය නිරන්තරයෙන් අගය කළහ. පුද්ගලයා විසින් සිදුකරනු ලබන චේතනාන්විත සියලු ක්‍රියාවන්හි වගකීම පුද්ගලයා වෙතම පැවරූහ. එහි සියලු විපාක පුද්ගලයා විසින්ම විඳිය යුතු බව බෞද්ධ ඉගැන්වීමයි. ආදි බෞද්ධ ඉගැන්වීම් තුළ පුද්ගල අධිකාරිත්වය අර්ථවත් වන්නා වූ සූත්‍ර දේශනා රාශියක් හමු වේ.

***යදා තුම්හෙ කාලාමා අත්තනාව ජානෙය්‍යාථ ඉමෙ ධම්මා අකුසලා ඉමෙ ධම්මා සාවජ්ජා ඉමෙ ධම්මා විඤ්ඤුගරහිතා ඉමෙ ධම්මා සමත්තා සමාදින්නා අහිතාය දුක්ඛාය සංවත්තන්තීති අථ තුම්හෙ කාලාමා පජහෙය්‍යාථ*** (අං.නි. කාලාම සුත්ත)

***ආරද්ධං ඛො මෙ විරියං භවිස්සතීති සො අත්තානමෙව අධිපතිං කත්වා අකුසලං පජහති කුසලං භාවෙති සාවජ්ජං පජහති අනවජ්ජං භාවෙති සුද්ධං අත්තානං පරිහරති*** (අං.නි. අධිපතෙය්‍ය සුත්ත)

මෙසේ පුද්ගල අධිකාරීත්වය හිමිකරදීමෙන් වර්ගවාදී වූ මානසිකත්වයෙන් මිදීමට හැකියාව ඇත. නිදහස් චින්තනය අනුව ලෝකයේ සාවද්‍ය, නිරවද්‍ය දේ තමාටම විනිෂ්චය කිරීමට අවස්ථාව උදා වේ. එයින් යහපතෙහි යෙදීමටත් අයහපතෙන් මිදීමටත් අවස්ථාව සැලසේ. ඒ තුළ පුද්ගලයා කවර ජාතියක කවර ආගමක අයෙකු වුව ද එකම ආකාරයෙන් ඉපිද ඒ ආකාරයෙන්ම මරණයට පත්වන තේරුම් ගනී. එබඳු වූ මනුෂ්‍යයා විෂයෙහි සමාජය තුළ සම වූ අයිතිවාසිකමක් පැවතිය යුතු බව ද තේරුම් ගනී. තම යහපත මෙන්ම අනෙකාගේ ද යහපත වෙනුවෙන් කටයුතු කරයි. ඒ තුළ ජනවාර්ගික අර්බුදය කෙතරම් දුරට සමාජය තුළින් ඉවත් කිරීමට අවකාශ ලැබෙන්නේදැයි විමසිය යුතුය.

නමුත් දේවවාදි ඉගැන්වීම් තුළ වන්නා වූ බාහිර බලවේගයන්හි අධිකාරීත්වය විෂයෙහි මිනිසා යොමු වූ කළ සියල්ල සිදුවන්නේ බාහිර බලවේගයන්ට අනුකූලවය. මිනිසාට කිසිදු ක්‍රියාවක් ස්වච්ඡන්දතාවයට අනුව සිදුකිරීමට අවකාශ ලැබෙන්නේ නැත. එසේ වූ විට ස්ව කැමැත්තට අනුව සිදුනොවන්නා වූ ක්‍රියාවන් විෂයෙහි පුද්ගලයාට කවර වගකීමක් දරන්නට හැකිවේ ද ? යනු බුදුසමය නගන්නා වූ තර්කයයි. සියල්ල බාහිර බලවේගයන්හි අධිකාරීත්වය අනුව සිදුවේ නම් පුද්ගලයා විසින් සිදුකරනු ලබන හොඳ නරක සියලු ක්‍රියා විෂයෙහි ද එම බාහිර අධිකාරීත්වයටම වගකීම දැරීමට සිදු වේ.

සියල්ල දෙවියන් වහන්සේගේ කැමැත්තට අනුව සිදුවන බව දැක්වීමේ දී පුද්ගලයා කෙරෙන් කිසිකලෙක වර්ගවාදි මානසිකත්වය ඉවත් කිරීමට හැකියාවක් නොමැත. මන් ද, දේවවාදී බොහෝ ආගම් තුළ අන්‍ය දර්ශනයන් හෙලා දැකීමට යොමු වී ඇති අතර ඇතැම් සමාජ සම්මතයන්ට අනුව වැරදි සහගත ක්‍රියාකාරකම් ද යහපත් යැයි අනුමත කොට ඇති බැවිනි. එසේම ඔවුන්ගේ ආගමික ඉගැන්වීම් වලට අනුව කටයුතු නොකිරිම ද අන්‍ය දර්ශනයන් අධ්‍යයනය කිරීම ද පුද්ගලයා විසින් සිදුකරනු ලබන බරපතල වූ වැරදි ක්‍රියාවන් සේ දක්වා ඇති බැවිනි. දේවවාදි ඉගැන්වීම් ඉතා දැඩි සේ ක්‍රියාත්මක වන්නා වූ මැදපෙරදිග රටවල උක්ත ක්‍රියාවන් විෂයෙහි මරණ දණ්ඩනය පවා ක්‍රියාත්මක වන ආකාරය දැකගත හැකිය.

මෙසේ ලෝකයේ ඕනෑම රටක වේවා පවතින්නා වූ ජනවාර්ගික අර්බුදයන් නැති කිරීම සඳහා ඇත්තා වූ ප්‍රමුඛ සාධකය වන්නේ නිදහස් චින්තනය රටක් තුළ ක්‍රියාත්මක කිරීමයි. සදාචාරාත්මක පරිසරයක් තුළ පුද්ගලයාට ස්වච්ඡන්දතාවයෙන් යුක්තව කටයුතු කිරීමට අවස්ථාව සැළසීමයි. සියලු දෙනාට ඕනෑම ආගමක්, දර්ශනයක් අධ්‍යයනය කොට නිවැරදි වූ චින්තනය තෝරා ගැනීමට අවස්ථාව උදාකරලීමයි. මෙහි දී ආගමික හෝ ජාතික වශයෙන් හෝ යම් වර්ගයක් උදෙසා වන්නා වූ නායකත්වය විෂයෙහි ප්‍රමුඛ වූ වගකීමක් පැවරී ඇත. එනම් උක්ත නිදහස් චින්තනය විෂයෙහි ජනතාවට සාධාරණ වූ අවස්ථාවක් උදාකරලීමයි. ජාතිවාදි ඉගැන්වීම් බොහෝ සෙයින් දක්නට ලැබෙනුයේ ආගමික පසුබිම් තුළ බැවින් ආගමික නායකයින් වර්තමානයේ දී මධ්‍යස්ථ වූ මතධාරීන් ලෙස කටයුතු කිරීම ද ඉතා වැදගත් වූ කාරණාවක් ලෙස පෙන්වා දිය හැකි ය. ශ්‍රී ලාංකික සමාජය තුළ ජීවත් වන්නා වූ බහුජන නියෝජනය බෞද්ධ ආගමිකයන් බැවින් අප රට තුළ නිර්මාණය වී ඇත්තා වූ ජනවාර්ගික අර්බුද විසදීම විෂයෙහි භික්ෂූන් වහන්සේලාට විශාල වූ කාර්යභාරයක් පැවරී ඇත.

**ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදය විසඳීමේලා භික්ෂුවගේ කාර්යභාර්යය**

'භික්ඛු' යන පදය යෙදෙනුයේ අන්‍යයන්ගෙන් යැපීම් අර්ථයෙනි. '***භික්ඛං චරතීති භික්ඛු'*** මෙයින් අදහස් වනුයේ අන්‍යයන්ගෙන් යමක් ලැබෙයි ද එයින් යැපෙමින් සරල වූ ජීවිතයක් ගතකරන්නා වූ පුද්ගලයා යන අදහසයි. ඔහු සියලු ලෞකික අපේක්ෂාවන්ගෙන් විනිර්මුක්ත වූවෙකි. සියලු බැඳීම් වලින් තොර වූවෙකි. විමුක්ති සාධනය සඳහා ක්ලේශ ප්‍රහාණයට යොමු වූවෙකි. ගිහි ස්වරූපයෙන් වෙන් වූ ස්වරූප ඇත්තෙකි. ආදි බෞද්ධ දර්ශනය අනුව භික්ෂුව උක්ත ආකාරයෙන් විග්‍රහ වුව ද බුදුසමය තුළ භික්ෂුව සමාජයෙන් වෙන්වූ පුද්ගලයෙකු ලෙස අර්ථ දක්වා නොමැත. භික්ෂුව යනු ද සමාජගත

පුද්ගලයෙකි. සමාජය විෂයෙහි භික්ෂුවගේ ද වගකීමක් මෙන් ම බැඳීමක් ද පවතී. ක්ලේෂ ප්‍රහාණය උදෙසා නිර්වාණගාමී මාර්ගයට යොමු වුව ද භික්ෂුව යනු ඉන්ද්‍රිය හීනත්වයෙන් යුතු, යහපත අයහපත නොතෙරෙන්නා වූ සත්ත්ව කොට්ඨාසයක් ද නොව. මේ අනුව භික්ෂුව සමාජ ගැටලු විෂයෙහි අහක බැලීම හෝ නිහඬව සිටීම බෞද්ධ දර්ශනයෙහි සඳහන් නොවූවකි. එබැවින් උන්වහන්සේ සමාජ ප්‍රගමනය විෂයෙහි ඍජු දායකත්වයක් දැක්විය යුතුය. බුද්ධ චරිතය පිළිබඳ අධ්‍යයනයේ දී ලොවුතුරා බුදුරජාණන් වහන්සේ සමාජ ගැටලු විෂයෙහි මැදිහත් වී කටයුතු කළ ආකාරය ආදි බෞද්ධ දේශනාවන් තුළ ප්‍රකටව දැකිය හැකිය. ස්ව බන්ධු වර්ගයා වූ ශාක්‍ය කෝලිය දෙපිරිස රෝහිණී නදියෙහි ජලය සම්බන්ධව ඇති වූ අර්බුදය නිමා වූයේ බුදුරජාණන් වහන්සේගේ මැදිහත් වීමෙනි. චක්කවත්තිසීහනාද, කූටදන්ත වැනි දේශනා තුළින් නිවැරදි රාජ්‍ය උපදෙස් ලබාදෙමින් ධාර්මික රාජ්‍ය පාලනයක් සඳහා ක්ෂත්‍රීය ප්‍රජාව යොමුකරලූයේ බුදුරජාණන් වහන්සේ විසිනි. බ්‍රාහ්මණ ධර්මයන් අනුව නිර්මාණය වී තිබූ මනුෂ්‍ය වර්ගවාදීත්වය උදෙසා නොයෙකුත් දේශනා පවත්වමින් බුදුසසුන තුළ සමාජයේ කුල හීනයැයි සම්මත වූ පිරිසට පවා උතුම් පැවිද්ද ලබා දෙමින් සමාජ සාධාරණත්වය උදෙසා කටයුතු කරන ලද්දේ බුදුරජාණන් වහන්සේ විසිනි. එමෙන්ම සමාජය තුළ ඉතා පහත් මට්ටමට ඇද දමා තිබූ කාන්තාවට නිසි ගෞරවය ලබා දුන්නේ ද බුදුරජාණන් වහන්සේ විසිනි. මෙම නිදසුන් කිහිපයම බුදුරජාණන් වහන්සේ සමාජ සේවකයෙක්, සමාජ විශ්ලේෂකයෙක්, සමාජ වාදියෙක්, සමාජ නායකයෙක් බව පෙන්වා දීමට ප්‍රමාණවත් වේ.

මේ අනුව උන්වහන්සේගේ ශ්‍රාවකයන් වන්නා වූ භික්ෂූන් වහන්සේලාට සමාජ ප්‍රගමනය උදෙසා මැදිහත් වීමේ පූර්ණ අයිතියක් මෙන් ම වගකීමක් ද පවතී. නමුත් මෙහි දී භික්ෂුව විසින් තේරුම්ගත යුතු කල්පනා කළ යුතු ප්‍රමුඛ කරුණක් වේ. එනම් ඔහු කුමන කරුණක් සිදු කළ ද එය භික්ෂුත්වයට හානියක් සිදු නොවිය යුතු බවයි. එසේ ම තමාට උරුම වන්නා වූ සීමාව තුළ පමණක් සිට ක්‍රියා කිරීම යි. ඔහු කිසිවිටෙක ගිහියාගේ ස්වරූපයට පත් නොවිය යුතු ය. සිය ගෞරවය නිරන්තරයෙන් ආරක්ෂා කරගැනීමට භික්ෂුව කටයුතු කළ යුතු ය.

සමාජ ක්‍රියාවන් විෂයෙහි භික්ෂුවගේ ප්‍රධාන කාරණය අනුශාසනාවයි. ඒ තුළ පිහිටා සමාජ ප්‍රගමනය උදාකිරීමට භික්ෂුවට හැකියාවක් පැවතිය යුතු ය. වර්තමාන ශ්‍රී ලංකාව තුළ නිර්මාණය වී ඇත්තා වූ ජනවාර්ගික අර්බුදය විෂයෙහිලා භික්ෂුවගේ දායකත්වය පිළිබඳ විමසීමේ දී උක්ත පරිච්ඡේදය තුළ දැක් වූ ආකාරයට ශ්‍රී ලංකාව තුළ මෙම ජනවාර්ගික අර්බුද නිර්මාණය වීම විෂයෙහිලා බලපා ඇති කරුණු පිළිබඳ පළමුව විමසිය යුතු ය. එසේ ම එම මූලබීජයන්ට අනුව භික්ෂූන් වහන්සේලාට යම් කටයුත්තක් කිරීමට හැකිවේනම් එය උන්වහන්සේලාගේ දායකත්වය වේ. එයට අදාළ නොවූ කටයුතු සිදු කිරීම ජනවාර්ගික අර්බුදයන් වර්ධනය වීම පිණිසම හේතු වන බව අපගේ අදහසයි.

වර්තමානයේ දී ශ්‍රී ලංකාව තුළ නිර්මාණය වී ඇත්තා වූ ජනවාර්ගික අර්බුදයන් ද ඉහත දැක් වූ ආකාරයට ජාතිකත්වය, ආගමිකත්වය, දේශපාලනිකත්වය යන කාරණාවන් මූලිකව සිදුව ඇත. මෙහි දී ජාතිවාදි හා ආගම්වාදි ගැටුම් ඇතිවීම උදෙසා බලපානු ලබන පුද්ගල අනවබෝධය හා නිදහස් චින්තනයෙන් මිනිසා බැහැර කිරීම යන කාරණා අතුරින් පුද්ගල අනවබෝධය දුරු කිරීම උදෙසා

භික්ෂුවට පූර්ණ වූ දායකත්වයක් ලබාදිය හැකි ය. එම අවබෝධය සිංහල බෞද්ධ කොට්ඨාසයට පමණක් නොව පොදුවේ සියලු ජනතාව විෂයෙහි පැවැත්විය යුතු ය. බෞද්ධ භික්ෂුවට සිංහල බෞද්ධ ජනතාව විෂයෙහි අනුශාසනාවන් පැවැත්වීම, අර්ථයෙන් ධර්මයෙන් පෝෂණය කිරීම කිසිදු ගැටලුවක් නොමැත්තකි. නමුත් ජනවාර්ගික අර්බුදය තුළ අන්‍ය ජාතීන් විෂයෙහි ද මෙම පණිවිඩය රැගෙන යාම භික්ෂුවට ඇත්තා වූ ප්‍රධාන අභියෝගයකි. ඒ සඳහා මාධ්‍යය භාවිතය ද ප්‍රමුඛ ගැටලුවක් ලෙස සැළකිය හැකි ය. මේ සඳහා භික්ෂූන් වහන්සේ අන්‍ය භාෂාවන් ප්‍රගුණ කිරීම අවශ්‍යයෙන් සිදුකළ යුතු කරුණකි. එසේම සිය දේශනාවන් විෂයෙහි අන්‍ය ජාතීන් යොමුකරවා ගැනීමට ද භික්ෂුවට හැකියාවක් පැවතිය යුතු ය. අන්‍ය දේශයන් පවා බුදුසමයට නැඹුරු කරමින් බෞද්ධ දර්ශනය ලොව පුරා ප්‍රචාරය කරන්නට යෙදුණාවූ බෞද්ධ භික්ෂුවට මෙය කළ නොහැකි කටයුත්තක් සේ කිසිසේත් දැක්විය නොහැක.

අන්‍ය ඉගැන්වීම් තුළ ද මිනිසාට අහිමි වන්නාවූ නිදහස් චින්තනය නැවත ඔවුන් වෙත ලබාදීම සඳහා බෞද්ධ භික්ෂුව මාර්ගය පහදා දිය යුතුය. සැබවින්ම නිදහස් චින්තනයක් මිනිසාට හිමිවනුයේ බෞද්ධ දර්ශනය තුළ පමණි. ඒ අනුව උපතින් උරුමකම් කියන්නා වූ ආගමික පසුබිම අතහැර දමා පුද්ගලයෙකු බෞද්ධ දර්ශනය වෙත යොමු කරවා ගැනීම ඉතාමත් අසීරු කටයුත්තකි. නමුදු මෙය බෞද්ධ භික්ෂූන් වහන්සේ නමකට කළ නොහැකි කටයුත්තක් ද නොවේ. රටක් තුළ නිදහස් චින්තනයක් පුද්ගලයෙකුට උරුම වේද එම රට තුළ ජාතිවාදී ආගම්වාදී ජනවාර්ගික අර්බුදයන් නිමාකල හැකිබව අපගේ ආකල්පයයි. වර්තමාන ශ්‍රී ලංකාව තුළ ද නිර්මාණය වී ඇත්තා වූ මෙම ජනවාර්ගික අර්බුද විෂයෙහි පිළිතුර නම් නිදහස් චින්තනය වෙත මිනිසා යොමු කරවීමයි. මේ සඳහා බෞද්ධ භික්ෂුව මහත් දායකත්වයක් සැපවිය යුතු අතර, ඒ සඳහා උන්වහන්සේලා උපක්‍රම ශීලීව කටයුතු කළයුතු ද වේ. යම් දිනක අප රට තුළ සමස්ත ජනයා විෂයෙහි නිදහස් වූ චින්තනයක් උරුම වේ ද එදින භික්ෂුව ජනතාව උදෙසා යහපත අයහපත, හොඳ නරක ආදි වූ බෞද්ධ දර්ශනය පෙන්වා දිය යුතු ය. සමගිව එකමුතුව ජීවත් වීම තුළ පුද්ගලයාට ලැබෙන්නා වූ ප්‍රතිවිපාක පැහැදිලි කළ යුතු ය. මෛත්‍රී කරුණා මුදිතා උපේක්ෂා ආදි වූ ගුණාංගයන්හි වටිනාකම හුවා දැක්විය යුතු ය.

මෙම කාරණාවන්ට අමතරව ශ්‍රී ලංකාව තුළ ජනවාර්ගික අර්බුද නිර්මාණය වීම විෂයෙහි බලපානු ලබන තවත් ප්‍රමුඛ කාරණාවක් නම් දේශපාලනිකත්වයයි. බොහෝ දේශපාලනික පක්ෂ මෙන් ම විවිධ පෞද්ගලික වූ දේශපාලන නායකයන් මෙහි දී ස්ව පටු දේශපාලන අභිමථාර්ථයන් උදෙසා රට තුළ ජනවාර්ගික අර්බුද නිර්මාණය කරන්නා වූ ආකාරය දක්නට ඇත. නිදසුන් ලෙස සුළු ජනවර්ගයක් ඇත්තා වූ කොට්ඨාසයක් නියෝජනය කිරීම සඳහා නිර්මාණය වී ඇති දේශපාලන පක්ෂයක් හෝ චේවා දේශපාලන නායකත්වයක් හෝ චේවා ඔවුහු තම කණ්ඩායම උදෙසා පමණක් පෙනී සිටිමින් කටයුතු කරති. ඔවුන්ගේ හුදු දේශපාලනික අරමුණ වී ඇත්තේ සිය වර්ගයට අයත් පිරිසට පමණක් සේවාවන් සිදු කිරීමත් තම පෞද්ගලික වූ අරමුණු ඉටුකරගැනීමත් පමණි. මේ තුළ අසාධාරණයට ලක්වන්නා වූ අන්‍ය ජන කණ්ඩායම් දේශපාලනික නායකත්වයන්ට වඩා උක්ත සුළු ජන කණ්ඩායම් සමග නොයෙකුත් ගැටුම් නිර්මාණය කරගනු ලබන අයුරු දැකගත හැකි ය. මෙහි දී අවධාරණයෙන් දැක්විය යුතු කරුණක් වන්නේ පවතින්නා වූ රජයන් මේ පිළිබඳ ගන්නා වූ ක්‍රියාමාර්ගයන් ය. ඒ අනුව පැවති හෝ පවතින කිසිදු රජයක් අප රටෙහි ඇත්තා වූ ජනවාර්ගික අර්බුදය විසඳීම උදෙසා කිසිදු සාර්ථක ක්‍රියාමාර්ගයක්

ගෙන ඇතිබව දැකගත නොහැකි ය. ඒ වෙනුවට සිදුවන්නේ ද රජයේ සහ දේශපාලන නායකයන්ගේ පැවැත්ම උදෙසා ජනවාර්ගික අර්බුද විෂයෙහි අනුබල දීමකි. සියලු ජනතාවට සම වරප්‍රසාද දීමක් හෝ සාධාරණත්වයක් අප රටෙහි රජය තුළින් සිදුවනවාද යන්න ගැටලුසහගත කරුණකි.

දේශපාලනිකත්වය මූලිකව සිදුවන්නා වූ මෙම ජනවාර්ගික ගැටලු විෂයෙහි භික්ෂුවකගේ දායකත්වය කෙසේ සිදුවිය යුතු ද යන්න විමසීමේ දී භික්ෂුවට උරුම වූ පළමු මැදිහත්වීම නම් දේශපාලන නායකයන් උදෙසා අනුශාසනාවන් ලබාදීමයි. බුදුරජාණන් වහන්සේ ද දසරාජ ධර්ම, දස සක්විති වත් ආදිය තුළින් දැක්වූයේ ද මෙම දේශපාලනික අනුශාසනාවයි. බෞද්ධ භික්ෂුවගෙන් ද මෙම කටයුත්ත ඒ ආකාරයෙන් ම සිදුවීම උන්වහන්සේගේ වගකීමක් ලෙස ද සැළකිය හැකි ය.

දේශපාලන නායකයන් ද භික්ෂූන් වහන්සේගේ අවවාද අනුශාසනාවන් ඒ ආකාරයෙන් ම ක්‍රියාත්මක කළයුතු වේ. මන් ද භික්ෂුව කිසිදු ආකාරයෙන් පක්ෂග්‍රාහී වීම හෝ අයහපත ක්‍රියාත්මක නොකරන බැවිනි. නමුත් වර්තමාන ශ්‍රී ලාංකික දේශපාලනය මෙයට හාත්පසින් ම වෙනස් වූවකි. බෞද්ධ භික්ෂුව තම සීමාව තුළ කටයුතු කිරීම, නිවැරදි වූ අනුශාසනාවන් පමණක් සිදු කිරීම, පක්ෂග්‍රාහී නොවීම, පෞද්ගලික අභිමථාර්ථයන් සාධනයෙන් තොරවීම, උක්ත කරුණු සෑම භික්ෂූන් වහන්සේ නමකගෙන් ම වර්තමානයේ ඉටුවේ ද යන්න ගැටලු සහගත ය. එමෙන් ම වර්තමාන දේශපාලන නායකයන් ද බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ අවවාද අනුශාසනා පිළිපදිනවා ද යන්න ද ගැටලු සහගත ය. නොයෙකුත් සමාජ ගැටලු විෂයෙහි නැගී සිටින්නා වූ භික්ෂූන් වහන්සේලා සිරගත කරමින්, නොයෙකුත් තාඩන පීඩන කරමින් වන්නා වූ දේශපාලනික ක්‍රියාකාරකම් හමුවේ වර්තමාන භික්ෂූන් වහන්සේලාට ජනවාර්ගික අර්බුදයන් විෂයෙහි හෝ වෙනත් ගැටලුවක් විෂයෙහි සිය භික්ෂුත්වය ද ආරක්ෂා කරගනිමින් ඉටුකළ යුතු කාර්යය කුමක් දැයි පෙන්වා දීමට ද නොහැකි ය.

මෙහි දී සිදුවන්නේ කුමක් ද? භික්ෂූන් වහන්සේලාගේ අයහපත් ක්‍රියාකාරකම් නිසා දේශපාලනිකත්වය භික්ෂූන්ගේ අවවාද අනුශාසනා නොපිළිපදින්නේ ද, එසේ නැතහොත් දේශපාලන නායකයන් ඇතුළුව පවතින්නා වූ රජයන් සිය පැවැත්ම උදෙසා සිදුකරන්නා වූ නොයෙකුත් අකටයුතුකම් නිසා භික්ෂූන් වහන්සේලාට තම සීමාවෙන් එහා ගොස් කටයුතු කිරීමට සිදු වී ඇත්දැයි නුවණැත්තන් විසින් ම විමසා බැලිය යුතු ය. වර්තමාන භික්ෂුව දේශපාලන භූමිකාවට පැමිණෙන්නේ ද, නොයෙකුත් සංවිධාන නිර්මාණය කරගනු ලබන්නේ ද, ප්‍රසිද්ධ වූ විවේචනයන් එල්ල කරනුයේ ද, විරෝධතා පෙලපාළි ආදිය සඳහා මූලිකත්වය ලබාදෙන්නේ ද උක්ත කාරණාවන් පදනම් කොටගෙනය. මෙම ප්‍රකාශය ලාංකීය දේශපාලනය හා සම්බන්ධ වූ සියලු භික්ෂූන් වහන්සේලා උදෙසා දැක්වීම අනුචිත ය. මන් ද පෞද්ගලික ලාභ අපේක්ෂාවන් උදෙසා උක්ත කාරණාවන් සිදුකරන්නා වූ භික්ෂූන් වහන්සේලා ද මේ අතර වැඩසිටින බව කණගාටුවෙන් යුතුව වුව ද දැක්විය යුතු කරුණකි.

සැබවින් ම බෞද්ධ භික්ෂුව දේශපාලන භූමිකාවට පැමිණීම හෝ නොයෙකුත් සංවිධානයන් නිර්මාණය කොට එහි මූලිකත්වය ගැනීම භික්ෂුවගේ සීමාව ඉක්මවා යාමක් ලෙස දැක්විය හැකි ය. නමුත් ලංකාව තුළ මෙය අනුචිත ක්‍රියාවක් සේ පෙන්වා දීමට හැකියාවක් නොමැත්තේ අන්‍ය සුළු

දේශපාලනික පක්ෂ නායකයින් සහ පවතින්නා වූ රජයන් එක් ජන කොට්ඨාසයකට පමණක් වරප්‍රසාද ලබාදීමත් ඒ තුළින් අන්‍ය ජනතාව අසාධාරණයට ලක්වීමත් මත ය. එහි දී බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ අවවාද නොපිළිපදින්නා වූ දේශපාලන නායකත්වයන් උදෙසා එරෙහි වීම හැර අන් කටයුත්තක් පිළිබඳව අපගේ ද අදහසක් නොමැත.

වර්තමානයේ බෞද්ධ භික්ෂූන් වහන්සේ ද මධ්‍යස්ථ මතධාරියෙකු විය යුතු ය. එමෙන් ම පෞද්ගලික අභිමථාර්ථයන් හෝ වරප්‍රසාදයන් උදෙසා කිසිදු අකාරයකින් කටයුතු නොකළ යුතු ය. පක්ෂග්‍රාහි පුද්ගලයෙකු නොවිය යුතු ය. නිවැරදි යහපත් වූ අනුශාසනාවන් පමණක් ලබාදිය යුතු ය. තම ජාතිය ආගම මෙන් ම අන්‍ය ජාතීන් අන්‍ය ආගම් විෂයෙහි ද මධ්‍යස්ථව උපේක්ෂාවෙන් බැලීමට තම මානසික සංවර්ධනය සිදුකොට ගත යුතු ය. තම සීමාව මෙන්ම තම ගෞරවය ද නිරන්තරයෙන් ආරක්ෂා කොටගත යුතු ය. එසේම අවසානයේ මෛත්‍රී සහගත චිත්තයකින් යුක්තව සියලු ජනයා විෂයෙහි බෞද්ධ දර්ශනය, නිදහස් චින්තනය පෙන්වා දිය යුතු ය. එසේ වූ විට පමණක් අපරට තුළ ජනවාර්ගික අර්බුදයන් නිමාවනු ඇතැයි සිතිය හැකි ය. එසේම බෞද්ධ භික්ෂූන් වහන්සේගේ කාර්ය භාර්යය ද එයම වනු ඇත.